# සපුගොඩ අවලෝකිතේශ්වර ප්‍රතිමාව

මංගලිකා ජයතුංග

Sri Maha Viharaya at Sapugoda is located about 58 Kilometers south of Colombo and five hundred meters inland from the Galle-Colombo Highway. Although the Temple does not possess a recorded history, it is reasonable to assume that it is more than 150 years old. The unique feature in this temple is the image of Bodhisattva Avalokitesvara, with his Mahayanic characteristic (with three miniature Buddhas in the head- dress) enshrined in the Image House dedicated to the Buddha. In the opposite wall right in front of Avlokitesvara there is an emblem of the British Empire with a crowned king. Buddhist practices in Sri Lanka from ancient times throw considrable light on the fact that the Natha or Avalokitesvara was considered to be the protector of the country and the King. The objective of this paper is to bring material together in order to prove the above fact.

ක්‍රි.ව. 19 වන සියවස වන විටත් මහායාන බෝධිසත්ත්වවරයකු සේ සැලකෙන අවලෝකිතේශ්වර වන්දනය දක්ෂිණ ලංකාවේ ප්‍රචලිත ව පැවති බව සනාථ කෙරෙන සාධක කළුතර දිස්ත්‍රික්කයට අයත් බේරුවල සපුගොඩ ශ්‍රී මහා විහාරයෙහි දක්නට ලැබේ.

විහාරස්ථානයේ පෞරාණිකත්වය හා සබැඳි පුරාවෘත්ත සැලකිල්ලට ලක් කළ විට මෙය රාජාධිරාජසිංහ රජතුමා මහනුවර රාජ්‍ය කරන සමයේ එනම් ලන්දේසි පාලන සමයේ අවසාන කාල පරිච්ඡේදයේ (1790 පමණ) ගොඩ නංවන ලද්දක් බව පෙනේ. නමුත් මෙම විහාරයේ ප්‍රතිමා ගෘහයේ නිමවා ඇති චිත්‍ර හා මූර්ති 19 වන සියවසේ අග භාගයට අයත් වන බව ශෛලිය පිළිබඳ ව සැලකීමේ දී පැහැදිලි වේ. ඇතැම් චිත්‍ර මත ක්‍රි. ව. 1896 වර්ෂය සටහන් කර තිබීමෙන් මේ බව සනාථ වේ.

සපුගොඩ ශ්‍රී මහා විහාරයේ ප්‍රතිමාඝරයේ පිට මාලයේ දකුණු පස බිත්තියෙහි මකර තොරණින් සැදුම් ලත් ආරුක්කුවක මධ්‍යයෙහි අඩි 12ක උස ප්‍රමාණයකින් යුත් අවලෝකිතේශ්වර මූර්තියක් පිහිටුවා තිබේ. ප්‍රදේශ වාසීන් විසින් නාථ දෙවිඳුන් ලෙස සලකා වන්දනය කරන මෙම මූර්තියෙහි කිරීට මකුටයෙහි සමාධි මුද්‍රාවෙන් යුත් ධ්‍යාන බුදු රූ තුනක් පිහිටා ඇත. මකුටයෙහි ඉදිරිපස හා දෙපස මෙම රූප ස්ථානගතව පවතී. අවලෝකිතේශ්වර බෝසතුන් නිරූපණය කෙරෙන මූර්ති අතුරින් ධ්‍යාන බුදු රූ තුනක් සහිත